# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2283/16 - 2022 ජුනි මස 06 වැනි සඳුදා - 2022.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: PDV/LND/MISCL/I-16(i).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/9/2018/IR/276 හා 4-3/9/2018/IR/276-B.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත පිරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර* :

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 8 මෛත්‍රිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මෛත්‍රිපුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක හුමුපි 20, අතිරේක අංක 43, පත්‍ර අංක 105 හා 2021.08.30 දිනැති පිඹුරෙහි ඉඩම් විස්තර ලැයිස්තුවෙහි පිටු අංක 1449හි දක්වා ඇති හෙක්ටයාර් 2.2744 සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වල මායිම් :

1. **කැබලි අංක 8167**
ඉඩමේ නම: පදවිය කැලේ; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය, මෛත්‍රිපුර, පදවිය, එම්. ඩබ්. ප්‍රේමචන්ද්‍ර විසින් අනවසරයෙන් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්ටයාර 0.1012

2. **කැබලි අංක 8168**
ඉඩමේ නම: පදවිය කැලේ; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: දීමනා පත්‍ර අංක අනු/පද/ප්‍ර/1618 මෛත්‍රිපුර, ඞී යායහි පදිංචි ලියනගේලාගේ මෙරිල් ලියනගේ විසින් භුක්ති විඳ ඇත; ප්‍රමාණය: හෙක්ටයාර 1.4215.

3. **කැබලි අංක 8169**
ඉඩමේ නම: පදවිය කැලේ; විස්තරය: කුඹුර, ඇළ කොටස, මාර්ගය කොටස; හිමිකම් කියන අය: කිරිහාමිගේ සිරිසේන, දීමනා පත්‍ර අංක අනු/පද/ප්‍ර 1650 මෛත්‍රිපුර, පදවිය පදිංචි කිරිහාමිගේ සිරිසේන විසින් දීමනා පත්‍රයක් මත වගා කර ඇත; ප්‍රමාණය: හෙක්ටයාර 0.1012.

4. **කැබලි අංක 8170**
ඉඩමේ නම: පදවිය කැලේ; විස්තරය: කුඹුර, ඇළ කොටස, මාර්ගය කොටස; හිමිකම් කියන අය: රජය, මෛත්‍රිපුර, පදවිය පදිංචි තලගල ආරච්චිලාගේ දොන් දීප්ති චන්දන චන්ද්‍රසේන විසින් බලපත්‍ර අංක ඩී/08/39 ඒ යටතේ භුක්ති විඳ ඇත; ප්‍රමාණය: හෙක්ටයාර 0.7517.

ඉහත සඳහන් ඉඩමට පරවශ්‍යතාවයට හිමිකම් හෝ අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම එකී හිමිකම් අයිතිවාසිකම් හෝ සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තම තමන් හෝ ඔවුන්ගෙන් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි ඒ ඒ ඉඩම්

කැබලි අංක සඳහා පහත නියම කර ඇති වේලාවට පදවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

| *දිනය* | *වේලාව* | *ඉඩම් කැබලි අංකය* |
|---|---|---|
| 2022.07.18 | පෙ. ව. 9.30 | 8167,8168,8169, 8170 |

තවද, 2022.07.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම, ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එම්. සී. මලවිආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
පදවිය.

2022 ජුනි මස 02 වැනි දින,
පදවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06- 0070